# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.06 පැය 1535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/662/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. ව්‍යාජ ලෙස සකස් කරන ලද කෘමි නාශක ද්‍රව්‍ය අලෙවි කර මුදල් වංචා කිරීමකට අදාල සැකකරුවෙකු අත්අඩංගුවට - යක්කල පොලිස් ස්ථානය.**

2025.02.15 වන දින යක්කල පොලිස් ස්ථානයට වාතර්ා වූ ව්‍යාජ ලෙස සකස් කරන ලද කෘමිනාශක ද්‍රව්‍ය අලෙවි කර මුදල් වංචා කිරීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලකට අදාලව අවශකර සිටි සැකකරුවෙකු කඩුගන්නාව ප්‍රදේශයේ ලැගුම්හලක සැඟවී සිටින බවට ලද තොරතුරක් අනුව 2025.04.05 වන දින යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වන කිඩගම්මුල්ල, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු විසින් මෙම ව්‍යාජ ලෙස සකස් කරන ලද කෘමි නාශක ද්‍රව්‍ය වේයන් ඇතුළු කෘමීන් මර්දනය සඳහා යොදාගනු ලබන බවට එම ද්‍රව්‍ය අඩංගු බඳුන් වල මුද්‍රණය කර බෙදා හැරීම සිදුකර ඇති බවට අනාවරණය වී ඇත. මෙම ව්‍යාජ ලෙස සකස් කරන ලද කෘමි නාශක ද්‍රව්‍ය කිරිඇල්ල, කැළණිය, පමුණුගම, අවිස්සාවේල්ල, රඹුක්කන, මල්වතුහිරිපිටිය, මහනුවර, වාද්දුව, කොච්චිකඩේ, සපුගස්කන්ද, තලාතුඔය, මොරටුමුල්ල, මාවතගම ඇතුළු බොහෝ ප්‍රදේශ වල අලෙවි කර රුපියල් 4,000,000 (හතලිස් ලක්ෂයක්) ක් පමණ මුදලක් වංචා කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී වැඩිදුරටත් අනාවරණය වී ඇත.

යක්කල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සේරුනුවර පොලිස් ස්ථානය.**

2025.04.06 වන අද දින උදෑසන කාලයේ සේරුනුවර පොලිස් වසමේ සෝමපුර ප්‍රදේශයේදී සේරුනුවර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වන සෝමපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සේරුනුවර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**